## 2018 ජූනි මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්
### "තවද ඔවුන් වහන්සේ ඔවුන් සමඟ කෑමට හිඳගත් කල්හි රොටී ගෙන ආශිර්වාද පවසා කඩා ඔවුන්ට දුන් සේක"

(ශු.ලූක් 24:30)

මෙවර ශුද්ධාත්ම මහා මංගල්‍යයට සහභාගි වූ ඔබත්/මමත් සමස්ථ පුබුදු ජනතාවත්, ගිහි, පැවිදි, පූජක, රදගුරු සියළු දෙනාත් ශුද්ධාත්මයාණන්ගෙන් ලැබුණ වරප්‍රසාද රාශියකට හිමිකරුවන් වීමට වරම් ලැබුවායි කිසිම අනුමානයක් නැත. ඒ ගැන අපි දෙවි මහෝත්තමයාණන්ට ප්‍රශංසා කරමු. එමෙන්ම එදින අපට ලැබුණ තේමා වචනය ඔස්සේ ජීවිතයෙන් පිළිතුරු දීමට අවැසි ශුද්ධාත්ම බලය ඉල්ලා යාච්ඤා කරමු.

මරණයෙන් උත්ථාන වූ ජේසු ක්‍රිස්තු සමිඳාණන් හමුවන්නට, ඇසුරු කරන්නට කිතුනු අප සියළු දෙනාටම කැඳවීමක් ඇත. එමෙන්ම ඔවුන් වහන්සේගේ සුභාරංචිය ලොව පුරා ගෙන යාමට අපට ඇරයුමක් ලැබී ඇත. එහෙත් අප අතර ප්‍රකාශ වන ජේසු සමිඳාණන්ව හමුවන්නට, අත්දකින්නට බොහෝ කිතුනුවන්ට උවමනාවක් නැත. විශේෂයෙන් කතෝලික අපට දිව්‍ය පූජා යාගයේදී ශ්‍රී රුධිරයෙන් පවිත්‍ර වීමට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුලින් ඔවුන් වහන්සේම අප තුලට ඇතුළුකර ගැනීමට වාසනාවක් ලැබී ඇත. එමෙන්ම එකමුතුකම තුළ ඔවුන් වහන්සේව අත්දකින්නට ද අපට හැකිය.

එදා ශ්‍රාවකයන් දෙදෙනෙක් එම්මාවුස් නගරයට යද්දී ඔවුන් සමඟ ගමන් ගත් ජේසු සමිඳාණන්ව හඳුනා ගැනීමට නොහැකි වුනත්, ඔවුන් සමඟ නතර වී සිටි තැනට පැමිණීමේදී රොටී කඩා ආශිර්වාද කොට බෙදා ගැනීමේදී මේ ජේසු සමිඳාණන් යයි හඳුනා ගත්තාක් මෙන් අයැදීමේ සේවකයන් වශයෙන් මේ මාසය පුරාවටම බැති සිතින් දිව්‍ය පූජා යාගයට සහභාගි වීමටත්, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අභියස හැකි සෑම විටම පෙනී සිටීමටත්, සෑම කිතුනුවෙකුටම මේ වරප්‍රසාදය ගැඹුරු විශ්වාසයෙන් විඳ භුක්ති විඳීමටත් වරම් ලැබේවා'යි යාච්ඤා කරමු.

**"එකල ඔවුහු ඔවුන් වහන්සේ අප සමඟ මගදී කථා කරද්දීත්, ශුද්ධ ලියවිල්ල පහදා දෙද්දීත්, අපේ හදවත් දැවී ඇවිළී ගියා නොවේදැයි එකිනෙකාට කීහ."**

(ශු.ලූක් 24:32)

පළමු සතිය : දිව්‍යසය කියවීම - ශු.ලූක් 24:28-35

අයැදීමට විශේෂ යොමුව :

දිව්‍ය පූජා යාගය තුළදී පූපය ඔසවද්දී ජේසු සමිඳාණන්ගේ ශ්‍රී ශරීරයට පරිවර්ථනය කිරීමට වරම් ලැබී ඇති සියළු පූජකවරුන් වෙනුවෙන්. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* නොසැලකිලිමත් ලෙස දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන කිතුනුවන් වෙනුවෙන්.
* දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ වැඩ සිටින බව අදහා නොගන්නා මූලධර්මවාදී කිතුනුවන් වෙනුවෙන්.
* මාසයේ පළමු ඉරුදින පැවැත්වෙන සාංඝික පවුල් දිනය වෙනුවෙන් සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* ජූනි මස 09-10 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන ඇතුලාන්ත සුව සම්මේලනයට සහභාගි වන සියළු දෙනා සහ උපස්ථාන කණ්ඩායම වෙනුවෙන්.
* ජූනි මස 09-10 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන යැදුම් පාසලට සම්බන්ධ වන මොරටුව, කළුතර සාංඝිකයන්වල සියළු දෙනා හා වචනයේ සේවකයන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම් .....

දෙවන සතිය : දිව්‍යමය කියවීම - ශු.ජොහාන් 1:35-42

අයැදීමට විශේෂ යොමුව :

ස්වාමි තාත්තා, ඩෙනිස් තාත්තා ඇතුළු කිතු දන පුබුදුව තුළ දූත සේවාවට සම්බන්ධ වී අද අසනීප සහ ඔත්පලව සිටින්නාවූ සියළු දෙනා වෙනුවෙන්. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* ජූනි මස 15,16,17 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන තරුණ නායකයන්ගේ සම්මේලනය වෙනුවෙන්.
* පුබුදු දිවියෙන් ඈත් වී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* විදේශ රටවල පුබුදු සංඝයන් සහ ඒ සංඝයන්වල වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන්.
* පිළිකා, වකුගඩු, හෘදාබාධ ඇතුළු සුව කිරීමට ප්‍රමාද වන සියළු රෝගීන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම් .....

තෙවන සතිය : දිව්‍යමය කියවීම - ශු.ජොහාන් 6:35-40

අයැදීමට විශේෂ යොමුව :
දහම් පාසල් දරුවන් සහ දහම් පාසල් ගුරුවර - ගුරුවරියන් වෙනුවෙන්. (විනාඩි 10ක්)

වෙනත් අයැදීම් :
* ජූනි මස 23-24 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන පියවරුන්ගේ වාර්ෂික ඥානකාන්තිය වෙනුවෙන්.
* අන්ධ, ගොළු, බිහිරි සහ විවිධ ආබාධිතයන්ට ලක්වූ සියළු දෙනා වෙනුවෙන් සහ ඔවුන්ව රැකබලා ගන්නා අය වෙනුවෙන්.
* ගොවියන්, කම්කරුවන්, ධීවරයන් සහ සුළු පරිමාණයේ ව්‍යාපාර ගෙන යන සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම් .....

සතරවන සතිය : දිව්‍යමය කියවීම - ජාකොබ් 1:19-27

අයැදීමට විශේෂ යොමුව :
දේශය වෙනුවෙන්. (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් :
* මත්පැන්, මත් ද්‍රව්‍ය, අනියම් සම්බන්ධකම් සහ දුරාචාරයට යොමු වී සිටින තරුණ - තරුණියන් සහ වැඩිහිටියන් වෙනුවෙන්.
* පාසැල් දරුවන්, ගුරුවරුන් සහ විශ්ව විද්‍යාල සිසු සිසුවියන්, කථිකාචාර්යවරුන් වෙනුවෙන්.
* පවුල් ජීවිතවල අර්බුදකාරී තත්ත්වයන්ට මුහුණ දෙන සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම් .....

**"ඔබ වහන්සේගේ වචනය ද, කැමැත්ත ද ගින්නකි ; ආශීර්වාදයකි"**

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

*****************************